ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්
(සමාගම් අංකය: PB5180)
ඇක්සස් ටවර්ස් II (14 වන මහල),
නො. 278/4, යුනියන් පෙදෙස, කොළඹ 02,
ශ්‍රී ලංකාව.
දුරකථන:+94 11 2428428 | ෆැක්ස්:+94 11 2438438
විද්‍යුත් තැපැල (Email): info@fairfirst.lk |
වෙබ් අඩවිය: www.fairfirst.lk

# රක්ෂණ නිෂ්පාදන තොරතුරු ලේඛනය (IPID) -

**පුද්ගලික වගකීම් රක්ෂණ ඔප්පුව**

මෙම ලේඛනය මගින් ඔබගේ රක්ෂණ ඔප්පුව පිළිබඳ කෙටි සාරාංශයක් සපයයි. සම්පූර්ණ විස්තර සඳහා, කරුණාකර සම්පූර්ණ රක්ෂණ ඔප්පු ලේඛනය (Policy Document) සහ උපලේඛනය (Schedule) පරිශීලනය කරන්න. කිසියම් නොගැලපීමක් හෝ පරස්පරතාවක් ඇති වුවහොත්, රක්ෂණ ඔප්පු ලේඛනයේ (Policy Document) සඳහන් කරුණු බලාත්මක වේ.

**1. රක්ෂණ ආවරණ වර්ගය**

අනතුරින් වෙනත් අයෙකුට ශාරීරික තුවාල සිදු කිරීම හෝ ඔවුන්ගේ දේපළවලට හානි කිරීම හේතුවෙන් ඔබට නීතිමය වගකීමක් පැවරුණහොත්, ඉන් සිදුවන මූල්‍යමය පාඩුවලින් ඔබව ආරක්ෂා කිරීම සඳහා මෙම රක්ෂණ ඔප්පුව සකස් කර ඇත.

**2. ප්‍රධාන ප්‍රතිලාභ (ආවරණය වන කරුණු)**

මෙම රක්ෂණ ඔප්පුව මගින් ඔබේ රක්ෂණ උපලේඛනයේ (Policy Schedule) දක්වා ඇති "වන්දි සීමාව" (Limit of Indemnity) දක්වා ඔබේ නීතිමය වගකීම් ආවරණය කරයි.

2.1 තුවාල හෝ මරණය සඳහා වන නීතිමය වගකීම: ඔබේ ක්‍රියාවක් හේතුවෙන් අහඹු ලෙස වෙනත් අයෙකුට (තෙවන පාර්ශවයකට) ශාරීරික තුවාලයක් හෝ මරණයක් සිදු වුවහොත්, ඔබට ගෙවීමට සිදුවන නීතිමය වන්දිය අප විසින් ගෙවනු ලැබේ.

2.2 දේපළ හානි සඳහා වන නීතිමය වගකීම: ඔබ අහඹු ලෙස වෙනත් අයෙකුගේ දේපළකට හානියක් සිදු කළහොත්, ඔබට ගෙවීමට සිදුවන නීතිමය වන්දිය අප විසින් ගෙවනු ලැබේ.

2.3 නීතිමය ගාස්තු: අපගේ ලිඛිත පූර්ව අනුමැතිය ලබා ගන්නේ නම්, ඔබට එරෙහිව කෙරෙන හිමිකම් ඉල්ලීමකදී ඔබව ආරක්ෂා කිරීම සඳහා වන නීතිඥ ගාස්තු සහ අනෙකුත් වියදම්ද අප විසින් ආවරණය කරනු ලැබේ.

**3. ප්‍රධාන බැහැර කිරීම් (ආවරණය නොවන කරුණු)**

මෙම රක්ෂණ ඔප්පුව මගින් සෑම අවස්ථාවක්ම ආවරණය නොකෙරේ. ප්‍රධාන බැහැර කිරීම් පහත පරිදි වේ:

3.1 **ඔබේ පවුලේ අයට හෝ සේවකයින්ට වන වගකීම්:** ඔබේ පවුලේ සාමාජිකයන්ට, නිවැසියන්ට හෝ ඔබ යටතේ සේවය කරන යම් අයෙකුට සිදුවන තුවාල හෝ හානි ආවරණය නොවේ.

3.2 **ඔබේම දේපළවලට වන හානි**: ඔබට අයිති, ඔබ කුලියට ගත් හෝ ඔබේ භාරකාරත්වයේ පවතින දේපළවලට සිදුවන හානි ආවරණය නොවේ (උදා: ඉල්ලාගත් ලැප්ටොප් පරිගණකයක්).

3.3 **ව්‍යාපාරික ක්‍රියාකාරකම්**: ඔබේ රැකියාව, වෙළඳාම හෝ ව්‍යාපාරික කටයුතු නිසා ඇතිවන කිසිදු වගකීමක් ආවරණය නොවේ.

3.4 **දේපළ හිමිකාරිත්වය**: යම් ඉඩමක හෝ ගොඩනැගිල්ලක හිමිකාරිත්වය හෝ පදිංචිය සම්බන්ධයෙන් ඇතිවන වගකීම් ආවරණය නොවේ.

3.5 **වාහන, ගුවන් යානා සහ බෝට්ටු**: මෝටර් රථ, මෝටර් සයිකල්, බෝට්ටු හෝ ගුවන් යානා භාවිතය නිසා ඇතිවන වගකීම් ආවරණය නොවේ.

3.6 **සතුන් (සුරතල් සතුන් හැර)**: ඔබේ සුරතල් බලු හෝ පූස් හැර වෙනත් සතුන්ගෙන් සිදුවන හානි සඳහා වන වගකීම් ආවරණය නොවේ.

3.7 **ශ්‍රී ලංකාවෙන් පිටත සිදුවීම්**: මෙම රක්ෂණ ඔප්පුව අදාළ වන්නේ ශ්‍රී ලංකාවේ භූගෝලීය සීමාව ඇතුළත සිදුවන සිදුවීම් සඳහා පමණි.

3.8 **ගිවිසුම් මඟින් භාරගත් වගකීම්**: වෙනත් ආකාරයකින් ඔබට වගකීමක් පැවරෙන්නේ නැති, නමුත් ගිවිසුමක් මඟින් ඔබ භාරගත් වගකීම් අප විසින් ආවරණය නොකරයි.

**3.9 යුද්ධ සහ ත්‍රස්තවාදය.**

**ඉහත දක්වා ඇත්තේ ප්‍රධාන බැහැර කිරීම් පමණි. සම්පූර්ණ බැහැර කිරීම් ලැයිස්තුව සඳහා කරුණාකර රක්ෂණ ඔප්පු ලේඛනය බලන්න.**

**4. රක්ෂණ වාරික ගෙවීමේ ක්‍රමය**

ඔබේ රක්ෂණ වාරිකය වසරක් වන මුළු රක්ෂණ කාලසීමාව සඳහාම එකවර ගෙවීමක් ලෙස ගෙවනු ලැබේ.

**5. වැදගත් තොරතුරු හෙළිදරව් කිරීමේදී රක්ෂණ ඔප්පුහිමියාගේ වගකීම්**

5.1 සත්‍ය තොරතුරු සැපයීම: රක්ෂණය සඳහා ඉල්ලුම් කිරීමේදී ඔබ නිවැරදි සහ සම්පූර්ණ තොරතුරු සැපයිය යුතුය.

5.2 සාධාරණ ලෙස ප්‍රවේශම් වීම: තුවාල හෝ දේපළ හානි සිදුවිය හැකි අනතුරු වළක්වා ගැනීමට ඔබ සියලු සාධාරණ පියවර ගත යුතුය.

5.3 වෙනස්වීම් දැනුම් දීම: මෙම රක්ෂණ ආවරණයේ අවදානමට බලපෑ හැකි යම් සැලකිය යුතු වෙනසක් සිදු වුවහොත් ඒ පිළිබඳව අප වෙත දැනුම් දිය යුතුය.

**6. හිමිකම් ඉල්ලීමක් කිරීමේදී රක්ෂණ ඔප්පු හිමියාගේ වගකීම්**

ඔබට එරෙහිව හිමිකම් ඉල්ලීමක් කිරීමට හේතු විය හැකි සිදුවීමක් වුවහොත්, ඔබ පහත පියවර අනුගමනය කළ යුතුය:

1 වන පියවර : වගකීම භාර නොගන්න (DO NOT Admit Liability)

මෙය ඉතාමත් වැදගත් වේ. ඔබේ වරදක් බව පිළිගැනීම, කිසිදු යෝජනාවක් කිරීම හෝ අනෙක් පාර්ශවයට මුදල් ගෙවීමට පොරොන්දු වීම නොකළ යුතුය. වගකීම භාරගැනීමෙන් ඔබේ රක්ෂණ ආවරණය අහිමි වීමට ඉඩ ඇත.

2 වන පියවර : වහාම අප වෙත දැනුම් දෙන්න

හිමිකම් ඉල්ලීමකට හේතු විය හැකි ඕනෑම සිදුවීමක් පිළිබඳව වහාම අපට දැනුම් දෙන්න. **දින 15 ක්** ඇතුළත ලිඛිත විස්තර ලබා දිය යුතුය.

3 වන පියවර : සියලුම ලේඛන යොමු කරන්න

ඔබට ලැබෙන යම් ලිපියක්, නීතිමය නිවේදනයක් හෝ අධිකරණ ලේඛනයක් වහාම අප වෙත එවන්න.

4 වන පියවර : පූර්ණ සහයෝගය ලබා දෙන්න

ඔබ වෙනුවෙන් මෙම හිමිකම් ඉල්ලීම කළමනාකරණය කිරීමට අවශ්‍ය සියලුම තොරතුරු සහ සහයෝගය අප වෙත ලබා දිය යුතුය.

7. **පැමිණිලි සහ දුක්ගැනවිලි හැසිරවීම** (Complaints and Grievance Handling)

**පියවර 1** - ෆෙයාර්ෆස්ට් ඉන්ෂුවරන්ස් (Fairfirst Insurance) අමතන්න:

☎ +94 11 2428282 (පෙ.ව. 8:30 සිට ප.ව. 5:00 දක්වා)

✉ info@fairfirst.lk

ඔබට පවතින ගැටලු ෆෙයාර්ෆස්ට් හි අවදානම් සහ අනුකූලතා (Risk & Compliance) කණ්ඩායම වෙත යොමු කල හැකිය.

**පියවර 2** - බාහිර පාර්ශවයන් වෙත යොමු කිරීම (ගැටලුව විසඳී නොමැති නම්):

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL)

☎ +94 11 2335167 | ✉ info@ircsl.gov.lk | 🌐 www.ircsl.gov.lk

රක්ෂණ ඔම්බුඩ්ස්මන් (Insurance Ombudsman)

☎ +94 11 2505542 / +94 11 2505041 |

✉ info@insuranceombudsman.lk | 🌐 www.insuranceombudsman.lk

8. **වැඩි විස්තර සඳහා අප අමතන්න** (Contact Us for More ,Information)

ෆෙයාර්ෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් (Fair first Insurance Limited)

ඇක්සස් ටවර්ස් ii (14 වන මහල), අංක 278/4, යූනියන් පෙදෙස, කොළඹ 02, ශ්‍රී ලංකාව.

☎ 011-2428428 ද ✉ info@fairfirst.lk | www.fairfirst.lk

හිමිකම්පෑම් සම්බන්ධ විමසීම් සඳහා, කරුණාකර පහත සඳහන් මාර්ග ඔස්සේ අප වෙත යොමු වන්න:

විද්‍යුත් තැපැල (Email): nonmotorclaimsteam@fairfirst.lk

දුරකථන (Phone): +94 11 2428618

9. **වෙනත් යම් වැදගත් තොරතුරක්**

9.1 **හිමිකම් (අතිරික්තය / ස්වයං දායකත්වය )** (Deductible / Excess):

යම් හිමිකම් ඉල්ලීමක පළමු කොටස ඔබ විසින්ම ගෙවිය යුතුය. (Deductible) හෝ (Excess) ලෙස හැඳින්වෙන මෙම මුදල ඔබේ රක්ෂණ උපලේඛනයේ (Policy Schedule) දක්වා ඇත.

9.2 **භූගෝලීය සීමාව** (Geographical Limit):

මෙම රක්ෂණ ඔප්පුව මඟින් ආවරණය ලබා දෙන්නේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ සීමාව ඇතුළත සිදුවන සිදුවීම් සඳහා පමණි.

**සටහන:** "මෙම IPID (රක්ෂණ නිෂ්පාදන තොරතුරු ලේඛනය) මඟින් ප්‍රධාන ආවරණය සහ අදාළ නම් අතිරේක ආවරණ මෙන්ම රක්ෂණ ඔප්පුවේ ප්‍රධාන ලක්ෂණ පිළිබඳ සාරාංශයක් සැපයීමට අදහස් කරන අතර, එය ඔබේ නිශ්චිත පුද්ගලික අවශ්‍යතාවලට අනුව සකස් කරන ලද්දක් නොවේ. නිෂ්පාදනයේ සම්පූර්ණ සහ පුද්ගලීකරණය කළ තොරතුරු මෙන්ම බැහැර කිරීම් ඇතුළත් පූර්ව-ගිවිසුම්ගත සහ ගිවිසුම්ගත සම්පූර්ණ කොන්දේසි ඔබේ රක්ෂණ ඔප්පු ලේඛනයේ (policy document) දක්වා ඇත. මෙම IPID ලේඛනය රක්ෂණ ඔප්පුවේ/ගිවිසුමෙහි කොටසක් ලෙස නොසැලකේ. එබැවින්, කිසියම් පරස්පරතාවයක් ඇති වුවහොත් රක්ෂණ ඔප්පු ලේඛනයේ සඳහන් නියමයන් සහ කොන්දේසි බලාත්මක වේ."

****මෙම ලේඛනය සාමාන්‍ය අවබෝධය සඳහා පමණක් සරල ආකෘතියකින් සකස් කර ඇත. කිසියම් පැහැදිලි කිරීමක්, අර්ථ නිරූපණයක් හෝ විෂමතාවක් (විශේෂත්වයක්/පරස්පරයක්) මතු වුවහොත්, නිල ඉංග්‍රීසි රක්ෂණ ඔප්පු පාඨය බලපැවැත්වෙන අතර, සම්පූර්ණ නියමයන්, කොන්දේසි, බැහැර කිරීම් සහ ආවරණ විස්තර සඳහා සැමවිටම එය පරිශීලනය කළ යුතුය.**